## දකුණු පළාත් සභාව
## දකුණු පළාත් සංවර්ධන අධිකාරිය


# බටඅත දකුණ ගොවිපළ භූමිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික ආයෝජකයන්ගේ අභිලාෂ කැඳවීම (Expression of Interest)


1. **හැඳින්වීම**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හුංගම දකුණ ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇති බටඅත දකුණ ගොවිපොළ භූමිය අක්කර 28 රූඩ් 01 පර්චස් 29ක වපසරියකින් යුක්තය.කොළඹ මත්තල අධිවේගී මාර්ගයේ කසාගල පිවිසුමෙන් රන්න නගරය හරහා කි.මී 14.6ක දුරකින් කොළඹ-කතරගම ප්‍රධාන මාර්ගයෙන් ගුරුපොකුණ හන්දියට පැමිණ ගොවිපොළ භූමියට ළඟාවීමට හැක.

මෙම භූමිය ආසන්නයේ ආර්ථික වශයෙන් වැදගත් ස්ථාන මෙන්ම ඓතිහාසික වැදගත්කමකින් යුත් ස්ථාන රාශියක් පිහිටා ඇත.කලමැටිය ධීවර වරාය,උස්සන්ගොඩ ස්වභාවික ප්‍රදේශයට, ගොඩවාය වරායට, හම්බන්තොට උද්භිද උද්‍යානය, රිදියගම වැවට, රිදියගම මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය , ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, රිදියගම සත්වෝද්‍යානය, මදුනාගල උණුදිය උල්පත්, චන්ද්‍රිකා වැව, බඳගිරිය වැව, සෙවනගල සිනි කර්මාන්ත ශාලාව, හම්බන්තොට වරාය, මත්තල ගුවන්තොටුපල , හුම්මානය, සිත්තම්ගල්ල විහාරය, මුල්කිරිගල, කටුවන ලන්දේසි බලකොටුව ඉන් කිහිපයක් වේ.

<u>ඉඩමේ සැකැස්ම</u>





දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් මෙම බටඅත දකුණ භූමිය තුළ ආදර්ශ සමෝධාන ගොවිපලක් ඇති කර සත්ව අභිජනන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැළසුම් හා මෙහෙයුම්) කාර්යාලය මගින් මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබා ගෙන තිබුණි .ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සේවක ගොඩනැගිලි ඉදි කිරීම,ගවගාල් 2 ක් ඉදි කිරීම හා වගා කටයුතු වෙනුවෙන් මිලියන 40 ක පමණ වියදමක් දරා ඇත.

<u>භූමියේ වර්තමාන තත්වය</u>

- දකුණු පළාත් සංවර්ධන අධිකාරියට අයත්වන භූමියේ ප්‍රමාණය අක්කර 28 රූඩ01 පර්චස් 29 කි.
- වර්ග අඩි 1200 ක පමණ ක්ෂේත්‍ර ඵලයකින් යුතු ගව පාලනය වෙනුවෙන් ගොඩනැගිලි 02ක් ඉදිකර ඇත. (දිග අඩි 60 සහ පළල අඩි 20 ක්)
- වර්ග අඩි 759 ක පමණ ක්ෂේත්‍ර ඵලයකින් යුතු ආයතන ගොඩනැගිල්ල කාමර 03කින් සමන්විතව ඉදිකර ඇත. (දිග අඩි 33 සහ පළල අඩි 23)
- ප්‍රධාන මාර්ගයේ සිට පලමු මාර්ගයේ ඇති ආයතන ගොඩනැගිල්ල තෙක් තෙකලා විදුලිය ලබා ගෙන ඇති අතර අනෙකුත් ගොඩනැගිලි සඳහා එකලා විදුලිය ලබා ගෙන ඇත..
- අඩක් ඉදිකරන ලද මුර කුටියක් ඇත.

ඉහතින් දක්වා ඇති සම්පත් උපයෝගී කර ගත හැකි වන හෙයින් හා වඩාත් ඵලදායි ඉඩම් පරිහරණයක් තුළින් සංවර්ධන අධිකාරිය වෙත ආර්ථික වාසි ලබා ගත හැකි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ අදහස ඉස්මතු වීම මත නව ආයෝජන ප්‍රවේශයක් වෙත යොමු වීමට දකුණු පළාත් සංවර්ධන අධිකාරිය අපේක්ෂා කරයි.ඒ අනුව සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් ආදායම ඉහළ නැංවීමේ අරමුණින් උපාය මාර්ගික ආයෝජන ක්‍රමවේදයක් වන රාජ්‍ය, පෞද්ගලික හවුල්කාරීත්වය(PPP) යටතේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පෞද්ගලික අංශය වෙත පැවරීම තුළින් සාර්ථක ආයෝජනයක් සිදු කර වැඩි ආර්ථික වාසි ලබා ගැනීමට පෞද්ගලික ආයෝජකයන්ට අභිලාෂ ප්‍රකාශ කිරීමට අවස්ථාව සැලසීම මෙහිදී සිදු කෙරේ.

2. **ආයෝජකයන් / ලංසුකරුවන් සඳහා නියමයන් හා කොන්දේසි**

i. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ව්‍යාපාර ආයතනයක් විය යුතුය.

ii. සීමාසහිත පෞද්ගලික /පොදු සමාගමක් නම් සංස්ථාගත කිරිමේ සහතිකය(CERTIFICATE OF INCORPORATION OR REGISTRATION) සහ ව්‍යවස්ථාපිත සංවිධානයක්, තනි පුද්ගල ව්‍යාපාරයක්/හවුල් ව්‍යාපාරයක් නම් ලියාපදිංචි කිරිමේ සහතිකය ලබා තිබිය යුතුය.

iii. ආයෝජකයා විදේශිකයෙකු වන විට ව්‍යාපාරය ඉහත කොන්දේසි අංක (I) හා (II) කොන්දේසියේ හවුල් ව්‍යාපාර ආකෘතියට ව්‍යාපාරය ලියාපදිංචි වී තිබිය යුතුය.

iv. සමාගම් පැතිකඩ (COMPANY PROFILE) ඉදිරිපත් කළ යුතුය.

v. අභිලාෂය ප්‍රකාශ කරන අවස්ථාවේදී මූල්‍ය ආයතන විසින් අදාල සමාගම හෝ ලංසුකර අසාධු ලේඛනගත (BLACK LIST) කර නොතිබිය යුතුය.

vi. ව්‍යාපාරය ලියාපදිංචියෙන් පසුව ව්‍යාපාරික මෙහෙයුම් හි සක්‍රීයව අඛණ්ඩව කටයුතු කර තිබිය යුතුය.

vii. ආයෝජකයා විසින් සිදුකළ සමාගාමී ව්‍යාපෘති සම්බන්ධ පූර්ව අත්දැකීම්, ඒවායේ අදාලත්වය, තාක්ෂණික මට්ටම් සහ මූල්‍ය වටිනාකම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

viii. ආයතන ධාරිතාවය අනුව ලබාගෙන ඇති ජාතික හා ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් ලබා තිබීම අමතර සුදුසුකමක් වේ.

ix. පහත ව්‍යාපාර කටයුතු ආයෝජන ව්‍යාපෘතිය මගින් සිදු කළ නොහැක.

a) ලංකාවේ නීතියෙන් තහනම් වු ව්‍යාපාර වර්ග) ආරක්ෂක අමාතංශයේ නීති රීති වලට අනුගත නොවන ව්‍යාපාර , නිරෝධායන පනත යටතේ තහනමට ලක්ව ඇති ශාක හා සත්ව කොටස් අලෙවිය, ආක්‍රමණික හා කෘමි සතුන්ට හානිකර ශාක වගා කිරීම)

## 3. ඇගැයීම් නිර්ණායක

මෙම කාර්යය ඇගැයීම සඳහා පත් කරන ලද ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව මගින් පහත නිර්ණායක මත ඇගැයීම සිදු කර කෙටි ලේඛනගත කරනු ලැබේ.ඒහිදී අනුමැතිය හිමි වන ආයෝජකයන් වෙත අදාළ ගාස්තු අය කර ගැනීමෙන් අනතුරුව ව්‍යාපෘති සඳහා යෝජනා කැඳවීමේ නිවේදන (Request for Proposal) නිකුත් කරනු ලැබේ.

| නිර්ණායකය | විස්තරය | උපරිම ලකුණු |
|---|---|---|
| යෝජිත ව්‍යාපෘති යෝජනාව | ව්‍යාපෘති යෝජනාවේ ශක්‍යතාවය | 15 |
| ව්‍යාපෘති කළමනාකරණය | ආයෝජකයාගේ ව්‍යාපෘති කළමනාකරණ ප්‍රවේශය | 15 |
| සංවිධානය | ආයෝජකයාගේ සේවක කණ්ඩායම හා පළපුරුද්ද | 15 |
| ක්ෂේත්‍රයේ අත්දැකීම් හා පළපුරුද්ද | ක්ෂේත්‍රයේ අත්දැකීම් හා පළපුරුද්දේ මට්ටම | 10 |
| වෙනත් ව්‍යාපෘති | වෙනත් ව්‍යාපෘති මෙහෙයවීම පිළිබඳව අත්දැකීම් හා පළපුරුද්ද | 10 |
| මූල්‍ය ශක්‍යතාවය | ආයෝජකයාගේ මූල්‍යමය හැකියාව | 10 |
| මූල්‍ය ප්‍රතිලාභය | අධිකාරියට ඇති ප්‍රතිලාභිය | 25 |
| | **එකතුව** | **100** |

## 4. අභිලාෂ ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය

මේ සඳහා කැමැත්තක් දක්වන පාර්ශවයන් හට ඇමුණුම 1 මගින් දක්වා ඇති ආකෘති ප්‍රකාරව සිය අභිලාෂය ප්‍රකාශ කළ හැක.

EOI ලේඛන ඉදිරිපත් කිරිමේදි පහත පියවරයන් අනුගමනය කළ යුතුය.

01. සියලුම EOI ලේඛන කවරයක බහා මුද්‍රා තබා එහි වම් ඉහළ කෙළවරේ "හුංගම බටඅත සමෝධාන ගොවිපළ භූමිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ සංවර්ධනය කිරිම සඳහා වූ EOI ලේඛන" යනුවෙන් සඳහන් කළ යුතුය.
02. අදාළ මුද්‍රා තැබූ කවරය 2024.07.22 දින ප.ව. 2.00ට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්, දකුණු පළාත් සංවර්ධන අධිකාරිය, බාලදක්ෂ මාවත, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් බාර දිය හැක. එදිනට පසුව ලැබෙන EOI ලේඛන සලකා බලනු නොලැබේ.

## 5. EOI ලේඛන විවෘත කිරීම

සියලුම අභිලාෂය ප්‍රකාශ කිරීමේ ලේඛන (EOI) දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව විසින් 2024.07.22 දින ප.ව. 3.00ට විවෘත කෙරේ.